**ශීර්ෂය 254 - රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

**---------------------------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

**------------------**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

**--------------------------------**

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 24 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 08 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් **2019** දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**----------------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත් ,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.
- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) උප වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) මෙම වාර්තාවේ අංක 1.6.5(අ), 1.6.6(අ) හා (ආ), යන ඡේදයන්හි ඇතුළත් නිරීක්ෂණ සම්බන්ධයෙන් පසුගිය වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත් එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අක් මුදල් ගැලපුම් ගිණුම චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල නොවීම සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ. | | |
| (අ) භාණ්ඩාගාර පොත් අනුව රු. 356,759 ක් වූ අග්‍රිම ගිණුමේ ශේෂය රු. 816,630,475 ක් වශයෙන් දක්වා තිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව අක් මුදල් ගැලපුම් ගිණුම පිළියෙල කළ යුතු බව. | අග්‍රිම ගැලපුම් ගිණුමේ සඳහන් අයිතමයන් නිවැරදිව ඇතුළත් කිරීමට පැහැදිලි අවබෝධයක් නොතිබූ නිසා මෙම තත්ත්වය වාර්තා වී ඇති බව. |
| (ආ) වෙනත් අමාත්‍යාංශ හෝ දෙපාර්තමේන්තු විසින් රැස් කරගෙන තිබූ ආදායම රු. 1,240,913 ක් අඩුවෙන් ගලපා තිබුණි. | -එම- | නිවැරදි පිළිතුරක් ඉදිරිපත් කර නොමැත. |

| | | |
|---|---|---|
| (ඈ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්මේන්තු වෙනුවෙන් වැය කළ රු. 60,859,133 ක් හා වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්මේන්තු විසින් වැය කළ රු. 66,971,400 ක් ගලපා නොතිබුණි. | -එම- | නිවැරදි පිළිතුරක් ඉදිරිපත් කර නොමැත. |
| (ඇ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් සැසඳුම් ප්‍රකාශයේ ගෙවීම් හා ලැබීම් පිළිවෙලින් රු.63,469,606 ක් හා රු.10,869,143 ක් වැඩියෙන් ගලපා තිබුණි. | -එම- | අක් මුදල් ගැලපුම් ගිණුමට නිවැරදිව ගැලපුම් නොකිරීම සම්බන්ධයෙන් අදහස් දක්වා නොමැත. |
| (ඉ) තැන්පතු හා වෙනත් පොදු ලෙජර් ගිණුම් යටතේ ගැලපිය යුතු ශේෂයන් නොවුවද, එකතුව රු. 73,974,077 ක හර ශේෂ හා රු. 5,743,635 ක බැර ශේෂ ගලපා තිබුණි. | -එම- | අක් මුදල් ගිණුම පිළිබඳ මනා අවබෝධයක් නොමැති නිසා සිදු වී ඇති තත්ත්වය ඉදිරියේදී නිවැරදිව කිරීමට පියවර ගන්නා බව. |

### 1.6.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) භාණ්ඩාගාර පොත් අනුව ලියාපදිංචි ආදායම හා නොතාරිස්වරුන්ට වාර්ෂික මහාධිකරණ සහතික නිකුත් කිරීමේ ගාස්තු ආදායම රු. 1,696,533,184 ක් වුවද, එය රු. 1,695,298,379 ක් වශයෙන් රු. 1,234,805 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් හා මහාධිකරණවලින් වාර්තා ලබාගෙන නොතිබීමෙන් රැස් කළ ආදායමේ නිවැරදිතාවය | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් අගයන් භාණ්ඩාගාර පොත් සමඟ එකඟ විය යුතු අතර ආදායම් වාර්තාවලින් එම අගයන් සනාථ විය යුතු බව. | මහාධිකරණ කලාපවලින් එකතු කළ නොතාරිස් ආදායම හා ආදායමෙන් ආපසු ගෙවීම නිවැරදිව ගලපා නොමැති වීමත්, මාසික ආදායම් වාර්තාවලට සියළු ආදායම් නිසි පරිදි ඇතුළත් වී නොතිබීමත් හේතුවෙන් භාණ්ඩාගාර මුද්‍රිත සටහන්වල ඇතුළත් ආදායම සැසඳිය නොහැකි බව. |

| | | |
|---|---|---|
| තහවුරු කර ගැනීමට විගණනයට නොහැකි විය. | | |
| (ආ) ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයකින් හා කළාප කාර්යාලයකින් රැස් කළ රු.8,016,600 ක ලියාපදිංචි ආදායම්, රජයේ ආදායමට බැර නොකර හිමිකම් රක්ෂණ අරමුදලේ ආදායමට බැර කර තිබුණි. | ආදායම නිසි පරිදි හඳුනාගෙන රජයේ ආදායමට බැර කළ යුතු බව. | නිවැරදි කිරීමට පියවර ගෙන ඇති බව. |
| (ඇ) භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව වෙනත් ලැබීම් රු.68,775,004 ක් වුවද, එය රු.69,165,604 ක් වශයෙන් රු.390,600 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් අගයන් භාණ්ඩාගාර පොත් සමඟ සැසඳිය යුතු බව. | වෙනත් ලැබීම්වලින් ආපසු ගෙවන ලද රු. 390,600 ක මුදල ගැලපීම් කර නොතිබූ බව. |

### 1.6.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2019 දෙසැම්බර් 31 දිනට පියවිය යුතු අග්‍රිම ගිණුමේ රු. 356,759 ක ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි. | අදාල අගයන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට ඇතුළත් කළ යුතු බව. | අතපසුවීමකින් වාර්තා කිරීමට නොහැකි වී ඇති බව. |
| (ආ) දේපල පිරියත හා උපකරණවල අගය භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් සමඟ සැසඳීමේදී වත්කම් අයිතම 04 ක අගය රු. 285,501,361 ක් අඩුවෙන් හා වත්කම් අයිතම 02 ක අගය රු. 231,902,412 ක් වැඩියෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි දක්වා තිබුණි. | අදාල අගයන් භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන සමඟ එකඟ විය යුතු බව. | භාණ්ඩාගාර පොත්වලට ඇතුළත් වී නොමැති තොරතුරු ඇතුළත් කිරීමටත්, තොරතුරු නිවැරදි කර භාණ්ඩාගාර මුද්‍රිත සටහන් සමඟ සැසඳීමටත් පියවර ගන්නා බව. |

| | | |
|---|---|---|
| (ඇ) වෙනත් අමාත්‍යාංශ 03 ක ප්‍රතිපාදන යටතේ මිලදීගත් රු. 128,861,425 ක වත්කම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි. | පවරා ඇති සියළු වත්කම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු බව. | පිළිතුර අදාළ නොවේ. |

## 1.6.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තත්‍ය මුදල් ගලා ඒම හා මුදල් ගලායාම පිළිවෙලින් රු.1,789,225,604 ක් හා රු.1,789,125,604 ක් වුවද එය රු.1,615,061,807 ක් හා රු.1,614,737,209 ක් වශයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුළත් කර තිබුණි. එම හේතුවෙන් මුදල් ගලා ඒම් රු.174,163,797 ක් හා මුදල් ගලායාම් රු.174,388,395 ක් අඩුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි. | මුදල් හා මුදල්වලට සමාන දෑ මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුළත් විය යුතු බව. | හරස් සටහන් ලැබීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුළත් වී නොමැති බව. |

## 1.6.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) ස්ථාවර වත්කම් ලේඛනය** | | |
| 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය/ මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනය අදාළ වන පරිදි විගණකාධිපතිගේ එකඟත්වය ඇතිව පවත්වා ගත යුතු බව. | අයිතීන් ලබාගත් දේපල ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමට පියවර ගන්නා බව. |

**(ආ) ඉන්ධන ලේඛනය**

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 1647(ඇ) ප්‍රකාරව ඉන්ධන ලේඛනයක් පවත්වා නොතිබුණි. | රෙගුලාසි ප්‍රකාරව ඉන්ධන ලේඛනයක් පවත්වා ගත යුතු බව. | අදහස් දක්වා නොමැත. |

### 1.6.6 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්**,** ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| **නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන් දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | සපයා ඇති පිළිතුර නිවැරදි නොවේ. |
| (ආ) විගණකාධිපතිවරයාට අවශ්‍යවන පරිදි නිශ්චිත කාල සීමාවක් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදුවන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.5 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | ඉදිරියේදී ප්‍රමාදයකින් තොරව පිළිතුරු ලබා දීම සඳහා පියවර ගන්නා බව. |

## 1.6.7 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) 1907 අංක 1 දරන නොතාරිස් ආඥා පනත | | | |
| (i) 27 (1) හා (2) වගන්ති හා 1951 අප්‍රේල් 27 දිනැති අංක 10/240 දරන ගැසට් පත්‍රය | වාර්ෂික නොතාරිස් නාමාවලිය 2016, 2018 හා 2019 වර්ෂයන්හි ප්‍රසිද්ධ කිරීමට කටයුතු කර නොතිබූ අතර, 2014, 2015 හා 2017 වර්ෂයන්හි මාස 10 ක සිට වර්ෂ 01කට වැඩි කාල ප්‍රමාදයකින් ප්‍රසිද්ධ කර තිබුණි. | විධිවිධාන ප්‍රකාරව සෑම වර්ෂයකම මැයි 01 වන දින නොතාරිස් නාමාවලිය ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කළ යුතු බව. | 2019 වර්ෂය සඳහා නොතාරිස් නාමාවලිය යාවත්කාලීන කරමින් පවතින බව. |
| (ii) 18 (3) වගන්තිය | මහාධිකරණවල ලේකම්වරුන් විසින් නොතාරිස් නාමාවලිය ඉදිරිපත් නොකිරීම හේතුවෙන්, වාර්ෂික සහතිකය ලබා නොගෙන ඔප්පු ලියා සහතික කළ නොතාරිස්වරුන් සම්බන්ධයෙන් විධිහීනතා වාර්තා වී නොතිබුණි. තවද, කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ 2016 හා 2017 වර්ෂයන්හි බලපත්‍ර ලබා නොගත් නොතාරිස්වරුන් 1,589 දෙනෙකු සම්බන්ධයෙන්ද අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | විධිවිධාන ප්‍රකාරව නොතාරිස් නාමාවලිය යාවත්කාලීන කර බලපත්‍ර ලබා නොගත් නොතාරිස්වරුන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බව. | මහාධිකරණවලින් අර්ධ වාර්ෂික වාර්තා නියමිත පරිදි නොලැබෙන බව. |

| | | | |
|---|---|---|---|
| (iii) 13 වන හා 30 වන වගන්ති හා 2005 අංක 12 දරන දඩ මුදල් වැඩි කිරීමේ පනත | ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 03 ක 2018 වර්ෂයේදී බලපත්‍ර අළුත් කර නොගත් නොතාරිස්වරුන් 53 දෙනෙකු විසින් ඔප්පු 4,018 ක් ලියා සහතික කර තිබූ නමුත් ඒ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | විධිවිධාන ප්‍රකාරව නීතිමය කටයුතු කළ යුතු බව. | කොළඹ මහාධිකරණයෙන් පමණක් 2018 වර්ෂයේ නාමාවලිය ලැබී ඇති බව හා සෙසු මහාධිකරණවලින් ලබා ගැනීමට පියවර ගන්නා බව. |
| (iv) 26 (ආ) වගන්තිය | ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 03 ක 2015 වර්ෂයේ සිට 2019 අගෝස්තු දක්වා නොතාරිස්වරුන් 467 දෙනෙකු විසින් හිස් වාර්තා 1,988 ක් ඉදිරිපත් කර නොතිබීම නිසා ඔප්පු ලියා සහතික කළේ ද යන්න සනාථ කර ගත නොහැකි විය. | විධිවිධාන ප්‍රකාරව හිස් වාර්තා ලබාගත යුතු බව. | නොතාරිස්වරුන් දැනුවත් කිරීමට පියවර ගන්නා බව. |
| (v) නොතාරිස් ආඥාපනතේ 31(6), (26) වගන්ති හා ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 4(1),(2) වගන්ති | ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 04 ක 2015 සිට 2019 අගෝස්තු දක්වා නොතාරිස්වරුන් 532 දෙදෙනෙකු විසින් ඔප්පු දෙවන පිටපත් 12,867 ක් භාර දී නොතිබූ නමුත් ඔවුන්ට විරුද්ධව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | ඔප්පු දෙවන පිටපත් බාර දෙන ලෙස දැනුම් දීමට හා නීතිමය පියවර ගැනීමට කටයුතු කරමින් පවතින බව. |
| (vi) 32, 41 (1) (අ) හා (ආ) වගන්ති | ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 03 ක 2000 – 2018 වර්ෂ අතර කාලය තුළ මියගිය නොතාරිස්වරුන් 30 දෙනෙකු භාරයේ තිබූ ලේඛන හා නිල මුද්‍රා ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | විධිවිධාන ප්‍රකාරව ඒවා භාර නොදුන් භාරකරුවන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු බව. | අවිස්සාවේල්ල කාර්යාලයේ තොරතුරු නොමැති බව හා අනෙකුත් කාර්යාලවලින් ලබා ගැනීමට කටයුතු කරනු ලබන බව. |
| (vii) 35 වන වගන්තිය | ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 04 ක නොතාරිස්වරුන් 311 දෙනෙකුට 2002 වර්ෂයේ සිට 2019 ජූලි දක්වා කාලය | විධිවිධාන ප්‍රකාරව සමථ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු බව. | මුදල් අය කර ගැනීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරමින් පවතින බව. |

| | | | |
|---|---|---|---|
| | තුළ රු. 4 ක සිට රු.5000 ක් අතර පරාසයකින් පනවා තිබූ එකතුවරු. 1,589,050 ක සමථ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) 1927 අංක 23 දරන ලේඛන ලියාපදිංචි කිරිමේ ආඥා පනත | | | |
| (i) ලේඛන ලියාපදිංචි කිරිමේ ආඥා පනතේ V වන පරිච්ඡේදයේ 28(1) හා (2)(අ) වගන්ති | ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 04 ක 2001-2018 කාලය තුළ ලියාපදිංචි කළ නමුත් ආපසු භාර නොදුන් ඉඩම් ඔප්පු 3,042 ක් පිළිබඳ ලැයිස්තු පවත්වා ගැනීමට හා රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත වාර්තා කිරීමට කටයුතු කර නොතිබුණි. | විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | පිළිතුර අසම්පූර්ණ වේ. |
| (ii) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 11 වන පරිච්ඡේදයේ 05 වන වගන්තිය | ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 04 ක 2001 ත් 2019 ත් අතර කාලය තුළ භාර දී තිබූ ඔප්පු දෙවන පිටපත් 119,285 ක් වෙළුම් කිරීමට කටයුතු නොකර බිම ගොඩ ගසා තිබුණි. | විධිවිධාන ප්‍රකාරව දෙවන පිටපත් වෙළුම්වලට බන්දවා ආරක්ෂා සහිතව තබා ගත යුතු බව. | කාර්යය මණ්ඩලයේ ඌනතාවය හේතුවෙන් වෙළුම් කිරීම ප්‍රමාද වී ඇති බව. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 | වටිනාකම රු. 1,118,400 ක කල් ඉකුත් වූ තැන්පතු 05 ක් රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | විමසීම් කර රාජ්‍ය ආදායමට බැර කළ යුතු බව. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගෙන ඇති බව. |
| (ඈ) 2009 ජුනි 17 දිනැති අංක 09/2009(I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | වැඩබලන රෙජිස්ට්‍රාර් ජනරාල් හා ඔහුගේ රියදුරු විසින් ඇඟිලි සලකුණු යන්ත්‍රයේ හෝ ලේඛනයක පැමිණීම හා පිටවීම සටහන් කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | ක්ෂේත්‍ර පරීක්ෂණවලට යාමට සිදු වන බැවින් පැමිණීම පිටවීම සටහන් කිරීමක් සිදු නොවන බව. |

(ඉ) 1970 රෙජිස්ට්‍රාර් ජනරාල් අත්පොත - ඔප්පු ලියාපදිංචි කිරීම

| | | | |
|---|---|---|---|
| (i) 375 (1) හා (2), 410 හා 411 වගන්ති | ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 02 ක 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ලැබී තිබූ දෙවන පිටපත් 155,714 ක් පරීක්ෂා කර විධිහීනතා නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | විධිවිධාන ප්‍රකාරව දෙවන පිටපත් පරීක්ෂා කර නොතාරිස් පරීක්ෂණ පොතට ඇතුළත් කළ යුතු බව. | නිලධාරි හිඟය නිසා කාර්යයන් ප්‍රමාද වූ බව. |
| (ii) 440 (2) වගන්තිය හා 2019 ජූලි 23 දිනැති අංක 11/2019 දරන රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ චක්‍රලේඛය | ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 03 ක නොතාරිස්වරුන් 304 දෙනෙකුට පනවා තිබූ හිඟ හා දඩ මුදල් රු. 4,075,921 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | විවිධාන ප්‍රකාරව හිඟ හා දඩ මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතු බව. | අය කර ගැනීමට අදාළ කටයුතු සිදු කරන බව. |
| (iii) රෙජිස්ට්‍රාර් ජනරාල් අත්පොතේ 452 වගන්තිය | ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 05 ක 2012 – 2019 අතර කාල පරිච්ඡේදය තුළ ඔප්පු දෙවන පිටපත් භාර නොදුන් නොතාරිස්වරුන් 09 දෙනෙකුට නඩු පැවරීමට කටයුතු කර නොතිබුණි. | විවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | පිළිතුර අසම්පූර්ණ වේ. |

## 1.6.8 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 මාර්ගෝපදේශය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ ඡායා පිටපත් සේවාව ලබා ගැනීම සම්බන්ධයෙන් ගෙවන ලද රු. 8,542,773 ක වැට් බදු වාර්තා අදාළ අංශ වෙත ඉදිරිපත් කර නොතිබුණි. | විධිවිධාන ප්‍රකාරව වැට් බදු ආවරණය සඳහා මුදල් ගෙවීමෙන් පසු ඊළඟ මාසයේ 15 වන දින හෝ එදිනට පෙර විගණකාධිපතිට පිටපත් සහිතව දේශීය ආදායම් කොමසාරිස් වෙත දැනුම් දිය යුතු බව. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තුව විසින් අග්‍රිම සැලැස්මක් සකස් කර නොතිබුණි. | අග්‍රිම සැලැස්මක් සකස් කළ යුතු බව. | ඉදිරියේදී අග්‍රිම සැලැස්ම ඉදිරිපත් කිරීමට සටහන් කරගත් බව. |
| (ආ) නිලධාරීන් 42 දෙනෙකුට අවස්ථා 42 කදී ලබාදුන් රු.2,618,490 ක අත්තිකාරම් මුදල් දින 07 ක සිට මාස 08 ක් දක්වා කාල පරාසයක ප්‍රමාදයකින් පියවා තිබුණි. | 2015 ජූලි 14 දිනැති අංක 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව සංශෝධිත මුදල් රෙගුලාසි 371 (2) ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |

### 2.2 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ලියාපදිංචි කිරීමේ මූලික ආදායම රු. 1,400,000,000 ක් වශයෙන් සකස් කළ මූලික ඇස්තමේන්තුව මහා භාණ්ඩාගාරය විසින් රු. 1,450,000,000 ක් ලෙස සංශෝධනය කර තිබුණි. දෙපාර්තමේන්තුව සකස් කළ ඇස්තමේන්තුව සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබූ අතර, ඇස්තමේන්තුගත ආදායමට වඩා සියයට 17 ක් වැඩියෙන් රු.1,689,706,685 ක ආදායමක් උපයා තිබුණි. | ආදායම් නිවැරදිව ඇස්තමේන්තු කළ යුතු බව. | ඇස්තමේන්තු ඉදිරිපත් කරන අවස්ථාවේදී කඩිනම් සේවා ආරම්භ කිරීම පිළිබඳ තොරතුරු අනාවරණය නොවූ බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ බලපත්‍රයක් නිකුත් කිරිමේ හා බලපත්‍රයක් අළුත්කිරීමේ ගාස්තුව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ ගිණුමට බැර කළ යුතු වීම සම්බන්ධයෙන් අවධානය යොමු නොකර නොතාරිස් ගාස්තු ආදායම රු. මිලියන 20 ක් වශයෙන් ඇස්තමේන්තු කර තිබුණි. එම හේතුවෙන් ඉපැයූ ආදායම රු.6,826,494 ක් හෙවත් සියයට 34 ක් පමණක් විය. | -එම- | මූලික ආදායම සංශෝධනය නොකළ බවට ආදායම් ගිණුමෙහි දක්වා තිබුණි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟහිටි ආදායම රු. 24,813,876 ක් වුවද, හිඟ ආදායම් ප්‍රකාශය අනුව එය රු. 62,411,624 ක් වීම, ප්‍රධාන කාර්යාලයේ හා ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලවල හිඟ ආදායම් වාර්තා අතර රු. 6,883,768 ක වෙනසක් පැවතීම හා රු. 1,373,919 ක ගෙවිය යුතු ශේෂයක් හිඟ ආදායමට හිලව් කර දක්වා තිබීම හේතුවෙන් හිඟ ආදායමේ නිවැරදිතාවය තහවුරු නොවුණි. | නිවැරදි වාර්තා තබා ගනිමින් හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතු බව. | පළාත් සභාවලට අයවිය යුතු ආදායම් ඇතුළත් වී ඇති බැවින් එම හිඟ ආදායම් පළාත් සභාවලින් අය කිරීමට චක්‍රලේඛයක් නිකුත් කර ඇති බව. |

## 2.3 වියදම් කළමනාකරණය

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | -------------------------- | ------------ | ----------------------------- |
| (අ) | විදේශ ගමන් වැය විෂයයට වෙන් කළ රු. 1,000,000 ක මූලික ප්‍රතිපාදනයෙන් | නිසි සැලසුම් ගත වැඩ පිළිවෙලක් ඔස්සේ ප්‍රතිපාදන වෙන් කර ගත | දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට විදේශ සංචාර නොලැබීම හේතුවෙන් |

| | | | |
|---|---|---|---|
| | රු. 700,000 ක් මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව මාරු කිරීමෙන් පසු රු. 300,000 ක සම්පූර්ණ මුදලම ඉතිරි වී තිබුණි. | යුතු බව. | මුදල් ඉතිරි වී ඇති බව. |
| (ආ) | පුනරාවර්ථන වැය විෂයයන් 09 ක රු. 244,550,000 ක් වු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 13 ක සිට සියයට 69 ක් අතර පරාසයකින් රු. 35,493,970 ක් හා ප්‍රාග්ධන වැය විෂයයන් 05 ක රු. 53,600,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 13 ක සිට සියයට 73.9 ක් අතර පරාසයකින් රු. 28,040,619 ක් ඉතිරි වී තිබුණි. | මනා කළමනාකරණයකින් යුක්තව කටයුතු මෙහෙයවා උපයෝජනය කළ යුතු බව. | භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබා දීම ප්‍රමාදවීම හා අක්මුදල් ප්‍රමාණවත් පරිදි නොලැබීම මෙම ඉතිරි කිරීම්වලට හේතු වී ඇති බව. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයට අමතරව වැය විෂයයන් 20 ක් සඳහා රු. 202,900,000 ක පරිපූරක ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන වෙන් කරවා ගෙන තිබුණි. | රෙගුලාසි ප්‍රකාරව අයවැය ඇස්තමේන්තු මඟින් සලසා ඇති ප්‍රතිපාදන සීමාවන් තුළම වියදම් කළමනාකරණය කර ගැනීමට කටයුතු කළ යුතු බව. | වැඩි වූ පිරිවැය සඳහා අතිරේක ප්‍රතිපාදන ලබා ගැනීමට සිදු වූ බව. |
| (ඈ) | ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් වෙන් කරන ලද ප්‍රතිපාදනවලින් සියයට 25 ක් ඉතිරි කළ යුතු වුවද, වැය විෂයයන් 07 ක රු. 43,400,000 ක් වූ ප්‍රතිපාදනවලින් ඉතිරිය රු. 5,083,107 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 3 ක සිට සියයට 20 ක් අතර පරාසයක විය. | 2019 අප්‍රේල් 08 දිනැති අංක 03/2019 හා 2019 සැප්තැම්බර් 24 දිනැති අංක 5/2019 දරන අයවැය චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | අසුරා තැබීම් පිළිබඳ භාණ්ඩාගාරයෙන් දැනුවත් නොකළ බව. |

## 2.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2019 දෙසැම්බර් 31 දිනට ස්ථාන මාරු වී ගිය, මියගිය, විශ්‍රාමගිය, වැඩ තහනම් කළ, සේවයෙන් පහ කළ, සේවය හැරගිය හා ඉල්ලා අස්වූ නිලධාරීන් 73 දෙනෙකුගෙන් අයවීම් හිඟහිටව තිබුණු ණය ශේෂ එකතුව රු. 2,824,898 ක් වූ අතර, එම හිගහිටි ණය ශේෂ මාස 03 ක සිට වර්ෂ 05 කට වැඩි කාල පරාසයක සිට පැවත එමින් තිබුණි. | ආයතන සංග්‍රහයේ **xxiv** පරිච්ඡේදය 4.6 හා 4.2.5 වගන්ති හා 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන අයවැය චක්‍රලේඛයේ 1.1.6 ඡේදය ප්‍රකාරව හිඟහිටි අත්තිකාරම් මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු බව. | පිළිතුරු සපයා නොමැත. |
| (ආ) සැසඳුම් ප්‍රකාශය අනුව තත්‍ය වියදම රු. 85,001,250 ක් වුවද, භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව එය රු. 87,219,942 ක් විය. දෙපාර්තමේන්තු පොත්වල ජර්නල් සටහන් මඟින් නිවැරදි කරන ලද රු. 2,218,692 ක් භාණ්ඩාගාරයට වාර්තා වී නොතිබී එයට හේතුව විය. | භාණ්ඩාගාර මුද්‍රිත සටහන් නිවැරදි විය යුතු බව. | පිළිතුරු සපයා නොමැත. |

## 2.5 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව රු. 4,052,020 ක් වූ බැරකම්, මූල්‍ය ප්‍රකාශනවල රු. 52,830,613 ක් වශයෙන් රු. 48,778,593 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.4 ඡේදය ප්‍රකාරව බැදීම් හා බැරකම් භාණ්ඩාගාර පොත් සමග සැසදිය යුතු බව. | ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීම දක්වා අදාළ තොරතුරු මූල්‍ය ප්‍රකාශන මඟින් පෙන්නුම් කරන අතර, ඉන්පසු ගෙවීම් බැරකම් ලේඛනයේ සටහන් කර, ගෙවීම් කිරීමට පියවර ගන්නා බව. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී මුදල් රෙගුලාසි 206(අ) විධිවිධානවලට පටහැනිව වැය විෂයයන් 08 ක රු. 7,286,699 ක් වූ ඉතිරි කිරීම් ඉක්මවා රු. 10,531,218 ක බැරකම් ඇතිකර ගෙන තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉතිරි කිරීම් නොඉක්මවා බැරකම් ඇති කරගත යුතු බව. | අදාළ වර්ෂයේදී ගෙවීමට නොහැකි වූ අත්‍යාවශ්‍ය වියදම් ඊළඟ වර්ෂයේදී ගෙවීමට සිදුවීමෙන් මෙම තත්ත්වය ඇති වන බව. |
| (ඇ) | වැය විෂයයන් 04 ක් යටතේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව තිබූ බැරකම් රු. 15,528,246 ක් බැරකම් ලේඛනයටත්, වැය විෂයයන් 02 ක් යටතේ බැරකම් ලේඛනයේ ඇතුළත් කරන ලද රු. 3,725,938 ක බැරකම්, මූල්‍ය ප්‍රකාශනවලටත් ඇතුළත් කර නොතිබුණි. | සියළු බැරකම් ලේඛනගත කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතු බව. | බැරකම් ලේඛනය හා මූල්‍ය ප්‍රකාශන අතර වෙනස්කම් පවතින බව. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ උපදෙස්වලට අනුකූලව ක්‍රියාකාරි සැලැස්ම සකස් කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ක්‍රියාකාරි සැලස්ම සකස් කළ යුතු බව. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. |

### 3.2 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය අවසානයට ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කාර්යයන්හි ප්‍රගතිය සම්බන්ධයෙන් කාර්යසාධන වාර්තාවක් සකස් කර නොතිබුණි. | වර්ෂය අවසානයට ප්‍රගතිය ඇතුළත්ව කාර්යසාධන වාර්තාව සකස් කළ යුතු බව. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) සිවිල් ලියාපදිංචිය හා ලේඛන ලියාපදිංචිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් විය. එසේ වුවද, වර්තමාන සංකීර්ණ ආර්ථික හා සමාජ තත්ත්වයන්, රාජ්‍ය ප්‍රතිපත්ති, තොරතුරු තාක්ෂණ වැඩසටහන්, රාජ්‍ය ආදායම් නිසියාකාරව රැස්කර ගැනීම ආදී කරුණුවලට අනුගත වන ආකාරයට ලියාපදිංචි කිරීමේ කටයුතු සම්බන්ධයෙන් වන නීති සංශෝධනය කිරීමේ නිසි වැඩපිළිවෙලක් | ලියාපදිංචි කිරීමේ කටයුතු හා සම්බන්ධ වන නීති සංශෝධනය කිරීමේ නිසි වැඩපිළිවෙලක් සකස් කළ යුතු බව. | නීති නිලධාරියෙකු 2020 ජූනි මස බඳවා ගෙන ඇති බව හා අදාළ කරුණු කෙරෙහි අවධානය යොමු කර ඇති බව. |

| | | | |
|---|---|---|---|
| | දෙපාර්තමේන්තුව තුළ නොවීමෙන් පැරණි පනත් හා ආඥා පනත් යටතේ තව දුරටත් කටයුතු සිදුවෙමින් පැවතුණි. | | |
| (ඇ) | e-Land Registry ව්‍යාපෘතිය මඟින්, පියවර 09 ක් හා දින 51 ක් ගතවන දේපල ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය දින 05 ක් හා පියවර 02 ක් දක්වා අඩු කර ගැනීමට බලාපොරොත්තු විය. එමගින් ව්‍යාපාරකරණය පහසු කිරීමේ දර්ශකයේ (Ease of Doing Business Index) උප දර්ශකයක් වන දේපල ලියාපදිංචි කිරීමේ දර්ශකය ඉහල නංවා ගනිමින් රටේ ආර්ථික කාර්යසාධනය හා ආයෝජන වාතාවරණය වඩා යහපත් කිරීම අපේක්ෂා කරනු ලැබීය.<br>එසේ වුවද, ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 20 ක තොරතුරු තාක්ෂණ වැඩසටහන් සඳහා නිසි සැලසුම්ගත වැඩපිළිවෙලක් නොතිබීම, තාක්ෂණික දැනුම ඇති නිලධාරීන් නොමැතිවීම, මෘදුකාංගය දෝෂ සහිත වීම ආදී හේතුන් නිසා සාර්ථකව ක්‍රියාත්මක නොවීය. තවද,ඉතිරි ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 25 හි මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. | අදාළ ගැටළු හඳුනා ගනිමින් e-Land Registry ව්‍යාපෘතිය සංවර්ධනය කර ව්‍යාපාරකරණය පහසු කිරීමේ දර්ශකයේ ශ්‍රී ලංකාවේ තත්ත්වය ඉහල නංවා ගත යුතු බව. | තොරතුරු තාක්ෂණ නිලධාරී පුරප්පාඩු පිරවීමට හා මෘදුකාංගය සංවර්ධනය කිරීම සඳහා යෝජනා කර ඇති බව. |

## 3.3 ප්‍රසම්පාදනයන්

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේදී ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමට හා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කිරීමට කටයුතු නොකර ජායා පිටපත් සේවාව සඳහා රු. 67,796,624 ක් වැය කර තිබුණි. තවද, ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් මුදලින් සියයට 5 කට නොඅඩු කාර්යයසාධන සුරක්ෂණයක් ලබාගත යුතු වුවද, ලබාගෙන තිබුණේ රු. 250,000 ක සුරක්ෂණයක් පමණි. | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4 හා 5.4.8 මාර්ගෝපදේශයන් ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1, 4.2.2 හා 4.2.3 මාර්ගෝපදේශයන් ප්‍රකාරව ප්‍රසම්පාදන කාල සටහනක් හා සවිස්තර ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණි. | මාර්ගෝපදේශයන් ප්‍රකාරව ප්‍රසම්පාදන කාල සටහනක් හා සවිස්තර ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු බව. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) ප්‍රසම්පාදන සැලැස්ම සංශෝධනය කිරීමට කටයුතු නොකර ප්‍රසම්පාදන වර්ග 04 කට ඇස්තමේන්තු කළ රු. 14,340,000 ක මුදල රු. 11,233,333 කින් ඉක්මවා වැය කර තිබූ අතර, සැලැස්මට ඇතුළත් නොවූ රු. 74,039,894 ක ප්‍රසම්පාදනයන් 05 ක් සිදු කර තිබුණි. | අවශ්‍යතාවයන් අනුව ප්‍රසම්පාදන සැලැස්ම සංශෝධනය කිරීමට කටයුතු කළ යුතු බව. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. |

## 3.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂයේ වත්කම් සමීක්ෂණ කටයුතු අවසන් කර නොතිබීමෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් රු. 2,224,707,985 ක වත්කම් වටිනාකම භෞතිකව සනාථ නොවීය. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව වත්කම් සමීක්ෂණ කටයුතු සිදු කළ යුතු බව. | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වත්කම් දෙපාර්තමේන්තුවේ කාර්යාලවල පවතින බැවින් භෞතිකව පරීක්ෂා කිරීම් සිදු කළ හැකි බව. |
| (ආ) දෙපාර්තමේන්තුවකින් හා අමාත්‍යාංශයකින් වාහන 20 ක් ලැබී තිබුණි. එසේ වුවද, රියදුරන් නොමැති වීම හා දෙපාර්තමේන්තුවට පවරා ගෙන නොමැති වීම හේතුවෙන් ආදායම් බලපත්‍ර හා රක්ෂණ සහතික ලබා ගැනීමට නොහැකිව එම වාහන නිෂ්කාර්යව පැවතුණි. | වත්කම් කාර්යක්ෂමව පරිහරණය කළ යුතු බව. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. |

## 3.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂයේ ඉඩම් ඔප්පු ලියාපදිංචි කිරීමේ එක් දින කඩිනම් සේවාව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබූ අතර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලවල එහි ආරම්භක උත්සව පැවැත් වීම සඳහා රු. 2,609,750 ක වියදමක් දරා තිබුණි. | සියළු කාර්යයන් සැලසුම්ගතව හා අරපිරිමැසුම්දායීව සිදු කළ යුතු බව. | පිළිතුරු සපයා නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) නොතාරිස්කෙනෙකුට දිවයිනේ ඕනෑම ස්ථානයක පිහිටි ඉඩමක ඔප්පුවක් ලියා සහතික කළ හැකි බවට නිරීක්ෂණය නොවූ අතර, 2018 වර්ෂයේදී අවිස්සාවේල්ල අධිකරණ කලාපයෙන් බැහැර කලාපවල ලියාපදිංචි වූ නොතාරිස්වරුන් 57 දෙනෙකු විසින් ලියන ලද ඉඩම් ඔප්පු 113 ක් එම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කර තිබුණි. | නොතාරිස් ආඥා පනතේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | නොතාරිස් ආඥාපනත අනුව නොතාරිස්වරයා කටයුතු කළ යුත්තේ තම බල ප්‍රදේශය තුළ පමණක් බව හා තමා පදිංචි දිස්ත්‍රික්කයේ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙත දෙවන පිටපත් භාර දිය යුතු බව. |
| (ඇ) ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 04 ක 2016-2019 වර්ෂ අතර කාලය තුළ ලියාපදිංචිය ප්‍රතික්ෂේප කළ ඔප්පු 1,421 ක් හා අඩුපාඩු හේතුවෙන් ලියාපදිංචි කළ නොහැකි වූ ඔප්පු 6,895 ක් සම්බන්ධයෙන් නොතාරිස්වරුන්ව දැනුවත් කර අදාළ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | නොතාරිස්වරුන්ව දැනුවත් කර සියළු කටයුතු නිසි පරිදි සිදු කළ යුතු බව. | නොතාරිස්වරුන්ව දැනුවත් කිරීමට කටයුතු කරනු ලබන බව. |
| (ඇ) ප්‍රවාහන පහසුකම් හිමි නොවන ප්‍රවාහන අංශය භාර නිලධාරිණියට රාජකාරි ස්ථානයේ සිට නිවස දක්වා ප්‍රවාහන පහසුකම් ලබාදී තිබුණි. තවද, එම වාහනයේ රියදුරු වාහනය අනවසරයෙන් රැගෙන යාම හා මත්ද්‍රව්‍යයක් ළඟ තබා ගැනීමත්, ධාවන සටහන් ලබා ගැනීමට ක්‍රියා නොකිරීමත් සම්බන්ධයෙන් නිලධාරිණියගෙන් කරුණු විමසීමට අමාත්‍යාංශ විමර්ශන වාර්තාව මඟින් නිර්දේශ කර තිබිය දී සියළු වරප්‍රසාද සහිතව ඇය විශ්‍රාම ගන්වා තිබුණි. | විනය පරීක්ෂණයන්ට යොමු වන නිලධාරීන් විශ්‍රාම ගැන්වීමේදී ආයතන සංග්‍රහයේ උපදෙස්වලටත්, වාහන පරිහරණය සම්බන්ධ චක්‍රලේඛ උපදෙස්වලටත් අනුකූල විය යුතු බව. | විශ්‍රාම ගැන්වීමේ අනුමැතිය සඳහා අදාළ ආයතන වෙත යොමු කළ අවස්ථාවේදී ඇයට විනය පරීක්ෂණයක් නොතිබූ බව. |

| | | |
|---|---|---|
| (ඉ) දෙපාර්තමේන්තු ප්‍රධානියාට අනුයුක්ත කළ වාහනය සමාලෝචිත වර්ෂයේ මාර්තු 15 දින සිට නොවැම්බර් 28 දින දක්වා කාලය තුළ කාර්යාල පරිශ්‍රයට පැමිණි බවට තහවුරු නොවුණි. තවද, එම වාහනයේ රියදුරු එම කාලය තුළ වෙනත් සංචිත වාහන 04 ක් ධාවනය කර තිබූ අතර දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ උපදෙස් මත සංචිත වාහන 06 ක් ලේඛන සහකාරවරුන් විසින් භාවිතා කර තිබුණි. | වාහන භාවිතය රෙගුලාසිවලට අනුකූල විය යුතු අතර මනා අභ්‍යන්තර පාලනයකට යටත් විය යුතු බව. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විධිවිධාන ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගෙන එම ඉලක්කයන්ට ලඟා වීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය - 2030" ට අනුගත වීම සඳහා පාර්ලිමේන්තුව විසින් සම්මත කර ඇති 2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත හා චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | පිළිතුරු සපයා නොතිබුණි. |

## 5. යහපාලනය

### 5.1 විගණන හා කළමනාකරණ කමිටුව

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2016 ජනවාරි 28 දිනැති අංක DMA/2009(I)(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ විගණන හා කළමනාකරණ කමිටුව කටයුතු කළ යුතු බව. | විගණන විමසුම සඳහා පිළිතුරු සපයා නොතිබුණි. |

**6.** **මානව සම්පත් කළමනාකරණය**

2019 දෙසැම්බර් 31 දිනට අනුමත හා තථ්‍ය කාර්යමණ්ඩලය පිළිවෙලින් 2,712 ක් හා 2,496 ක් වූ අතර දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 1,022.29 ක් වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තුවේ ගණන්දීමේ නිලධාරියා වන රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුර 2017 වර්ෂයේ ජනවාරි මාසයේ සිට රාජකාරි ආවරණය කිරීමේ හා වැඩ බැලීමේ පදනමින් පවත්වා ගෙන ගොස් තිබුණි. තවද, ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත තනතුරු 41 න් 23 ක් වසර ගණනාවක සිටම පුරප්පාඩු වී පැවතීමත් දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය කෙරෙහි බලපා තිබුණි. | අත්‍යාවශ්‍ය තනතුරු පුරප්පාඩු පුරවා ගෙන දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂම කර ගත යුතු බව. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |
| (ආ) රෙජිස්ට්‍රාර් සේවයේ II ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන තරඟ විභාගය පැවැත්වීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 18 ක එම තනතුර වැඩ බැලීම හා වැඩ ආවරණය කිරීමේ පදනමින් පවත්වා ගනිමින් තිබුණි. | බඳවා ගැනීම් පටිපාටිය අනුව කටයුතු කළ යුතු බව. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |
| (ඇ) සේවකයන් නිසි පරිදි අනුයුක්ත කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 14 ක හා කලාප කාර්යාල 09 ක ලේඛන සහකාරවරුන් හා පොත් බැඳුම්කරුවන් ද, කාර්යාල 26 ක කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් 110 ක් ද පුරප්පාඩු වී පැවතුණි. | සියළු කාර්යාලවලට නිසි පරිදි අනුයුක්ත කිරීම් සිදු කළ යුතු බව. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |